# ධම්මචක්කප්පවත්තන සුත්තං (පාළි)

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා බාරාණසියං විහරති, ඉසිපතනේ මිගදායේ.

තත්‍ර ඛෝ භගවා පඤ්චවග්ගියේ භික්ඛූ ආමන්තේසි.

ද්වේ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතේන න සේවිතබ්බා. යෝ චායං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ.

යෝ චායං අත්තකිලමථානුයෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථසංහිතෝ.

එතේ තේ ඛෝ, භික්ඛවේ, උභෝ අන්තේ අනුපගම්ම, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

කතමා ච සා, භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති?

අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, සෙය්‍යථීදං – සම්මාදිට්ඨී, සම්මාසඞ්කප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි.

අයං ඛො සා, භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

“ඉදං ඛො පන, භික්ඛවේ, දුක්ඛං අරියසච්චං. ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛෝ, මරණම්පි දුක්ඛං, අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ, පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං. සංඛිත්තේන, පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

“ඉදං ඛෝ පන, භික්ඛවේ, දුක්ඛසමුදයං අරියසච්චං – යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං – කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා.

“ඉදං ඛෝ පන, භික්ඛවේ, දුක්ඛනිරෝධං අරියසච්චං – යෝ තස්සා යේව තණ්හාය අසේසවිරාගනිරෝධෝ, චාගෝ, පටිනිස්සග්ගෝ, මුත්ති, අනාලයෝ.

“ඉදං ඛෝ පන, භික්ඛවේ, දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං – අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, සෙය්‍යථීදං – සම්මාදිට්ඨී, සම්මාසඞ්කප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාවෝ, සම්මාසති, සම්මාසමාධි.

“ඉදං දුක්ඛං අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

“ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහීනන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

"ඉදං දුක්ඛනිරෝධං අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකතන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

"ඉදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං භාවේතබ්බන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං භාවිතන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.

"යාවකීවඤ්ච මේ, භික්ඛවේ, ඉමේසු චතූසු අරියසච්චේසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහෝසි, නේව තාවාහං, භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.

යතෝ ච ඛෝ මේ, භික්ඛවේ, ඉමේසු චතූසු අරියසච්චේසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහෝසි, අථාහං, භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.

ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි – අකුප්පා මේ විමුත්ති, අයමන්තිමා ජාති, නත්ථි දානි පුනබ්භවෝ''ති.

ඉදමවෝච භගවා අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි – ''යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරෝධධම්ම''න්ති.

පවත්තිතේ ච පන භගවතා ධම්මචක්කේ, භුම්මා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං

සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

භුම්මානං දේවානං සද්දං සුත්වා චාතුමහාරාජිකා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

චාතුමහාරාජිකානං දේවානං සද්දං සුත්වා තාවතිංසා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

තාවතිංසානං දේවානං සද්දං සුත්වා යාමා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

යාමානං දේවානං සද්දං සුත්වා තුසිතා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

තාවතිංසානං දේවානං සද්දං සුත්වා යාමා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

යාමානං දේවානං සද්දං සුත්වා තුසිතා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

තුසිතානං දේවානං සද්දං සුත්වා නිම්මාණරතී දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

නිම්මාණරතීනං දේවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්තිනෝ දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

පරනිම්මිතවසවත්තීනං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි

වා ලෝකස්මි’’න්ති.

බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරෝහිතා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

බ්‍රහ්මපුරෝහිතානං දේවානං සද්දං සුත්වා මහාබ්‍රහ්මා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

මහාබ්‍රහ්මානං දේවානං සද්දං සුත්වා පරිත්තාභා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

පරිත්තාභානං දේවානං සද්දං සුත්වා අප්පමාණාභා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

අප්පමාණාභානං දේවානං සද්දං සුත්වා ආභස්සරා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

ආභස්සරානං දේවානං සද්දං සුත්වා පරිත්තසුභා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

පරිත්තසුභානං දේවානං සද්දං සුත්වා අප්පමාණසුභා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභකිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.

වේහප්ඵලා දේවානං සද්දං සුත්වා අවිහා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

අවිහානං දේවානං සද්දං සුත්වා අතප්පා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභකිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

වේහප්ඵලා දේවානං සද්දං සුත්වා අවිහා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

අවිහානං දේවානං සද්දං සුත්වා අතප්පා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

අතප්පානං දේවානං සද්දං සුත්වා සුදස්සා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

සුදස්සානං දේවානං සද්දං සුත්වා සුදස්සී දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකනිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.

ඉතිහ, තෙන ඛණේන, තේන මුහුත්තේන යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගච්ඡි. අයඤ්ච

දසසහස්සීලෝකධාතු සංකම්පි සම්පකම්පි සම්පවේධි; අප්පමාණෝ ච උළාරෝ ඔභාසෝ ලෝකේ පාතුරහෝසි, අතික්කම්ම දේවානං දේවානුභාවන්ති.

අථ බෝ භගවා ඉමං උදානං උදානේසි – ‘‘අඤ්ඤාසි වත, භෝ කොණ්ඩඤ්ඤෝ, අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ’’ති. ඉති හිදං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස ‘අඤ්ඤාසිකොණ්ඩඤ්ඤෝ’ ත්වේව නාමං අහෝසී‘ති.

සාදු සාදු සාදු..!!!

# ධම්මචක්ක පවත්තන සූත්‍රය (සිංහල)

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් මිගදායෙහි වැඩ වසන සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන් අමතා මේ ධම්මචක්ක දේශනය වදාළ සේක.

පින්වත් මහණෙනි, පැවිද්දන් විසින් සේවනය නො කළ යුතු වූ මේ අන්ත දෙකකි. යම් ඒ, කාමයන්හි කාමසුඛයෙහි ඇලී ගැලී වාසය කිරීමක් ඇත් ද, මෙය හීන වූ දෙයකි. ලාමක වූ දෙයකි. පුහුදුන් ජනයා විසින් සේවනය කරන දෙයකි. උත්තම මිනිසුන් විසින් සේවන නොකරන දෙයකි. අනර්ථ සහිත දෙයකි.

පින්වත් මහණෙනි, යම් ඒ, තමාව පීඩාවට පත් කරවන වැඩපිළිවෙළක් ඇත් ද, එය දුක් සහිත දෙයකි. උත්තම මිනිසුන් විසින් සේවනය නො කරන දෙයකි. අනර්ථ සහිත දෙයකි.පින්වත් මහණෙනි, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරන ලදි. මේ මධ්‍යම ප්‍රතිපදාව දහම් ඇස ලබා දෙයි. නුවණ උදා කරයි. සංසිඳීම ඇති කරයි. විශේෂ ඤාණය ඇති කරයි. අවබෝධය ඇති කරයි. නිවණ පිණිස පවතින්නේ ය.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, විශේෂ ඥානය ඇති කරන, අවබෝධය ඇති කරන, නිවණ පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක් ද..?

ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකල්පය ද, සම්මා වාචා, සම්මා කම්මන්තය ද, සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද සම්මා සමාධිය ද යන මෙය යි.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, විශේෂ ඥානය ඇති කරන, අවබෝධය ඇති කරන, නිවණ පිණිස පවතින්නා වූ ඒ මධ්‍යම ප්‍රතිපදාව නම් මෙය යි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි.ඉපදීම ද දුකකි. ජරාවට පත්වීම ද දුකකි, රෝග පීඩා වැළඳීම ද දුකකි. මරණය ද දුකකි. අප්‍රිය පුද්ගලයින් හා අප්‍රිය වස්තූන් සමග එක්වීම ද දුකකි. ප්‍රිය පුද්ගලයින් හා ප්‍රිය වස්තූන් ගෙන් වෙන්වීම ද දුකකි. කැමැති වන්නා වූ යම් දෙයක් ඇත් ද එය නො ලැබීම ද දුකකි. සංක්ෂේපයෙන් කීවොත්, පංච උපාදානස්කන්ධයෝ ම දුකකි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය යි. පුනර්භවය ඇති කරන, ආශ්වාදයෙන් ඇලෙන්නා වූ, ඒ ඒ තැන සතුටින් පළිගන්නා වූ යම් ඒ තණ්හාවක් ඇත් ද එය යි. එනම් කාම තණ්හාවය, භව තණ්හාව ය, විභව තණ්හාව ය.

“පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම නම් වූ ආර්ය සත්‍යය යි. ඒ තණ්හාවේ ම ඉතිරු නැති ව නො ඇල්මෙන් නිරුද්ධ වීමක් වේ ද, දුරු වීමක් වේ ද, තණ්හාවෙන් මිදීමක් වේ ද, ආලය නැති වීමක් වේ ද, එය යි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය යි. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකල්පය ද, සම්මා වාචා, සම්මා කම්මන්තය ද, සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද සම්මා සමාධිය ද යන මෙය යි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් ම අවබෝධ කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් ම අවබෝධ කරන ලදි'යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක ඇති වීම නම් වූ ආර්ය සත්‍යය යි (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක් ඇති වීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.ඒ දුක් ඇති වීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය වූයේ ය යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම නම් වූ ආර්ය සත්‍යය යි කියා (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක් නැති වීම නම් වූ ආර්ය සත්‍යය (විද්‍යා විමුක්ති වශයෙන්) සාක්ෂාත් කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක් නැති වීම නම් වූ ආර්ය සත්‍යය (විද්‍යා විමුක්ති වශයෙන්) සාක්ෂාත් කරන ලදි යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය යි කියා (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය (ශීල-සමාධි-ප්‍රඥා වශයෙන්) ප්‍රගුණ කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය (ශීල-සමාධි-ප්‍රඥා වශයෙන්) ප්‍රගුණ කරන ලදි යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි, මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතු ව, ආකාර දොළොසකින් යුතු ව සැබෑ තත්වය නම් වූ ඥාන දර්ශනය සුවිශුද්ධ ලෙස මා හට යම්තාක් අවබෝධ නො වූයේ වේ ද, ඒ තාක් කල් ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත

වූ ලෝකයෙහි, මරුන් සහිත වූ බඹුන් සහිත වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ "මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි"යි ප්‍රතිඥා නො දුන්නෙමි.

එහෙත් පින්වත් මහණෙනි, මා හට යම් කලක මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතු ව, ආකාර දොළොසකින් යුතු ව සැබෑ තත්වය නම් වූ ඥාන දර්ශනය සුවිශුද්ධ ලෙසට ම අවබෝධ වූයේ වේ ද, එකල්හි පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයෙහි, මරුන් සහිත වූ බඹුන් සහිත වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ "මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි"යි ප්‍රතිඥා දුන්නෙමි.

මා හට ඤාණ දර්ශනය පහළ විය. මාගේ චේතෝවිමුක්තිය වෙනස් නොවන්නේ ය. මෙය වනාහී අන්තිම ඉපදීම වේ. දැන් මා හට පුනර්භවයක් නැත්තේ යයි, භාග්‍යවතුන් වහන්සේ මේ ධම්මචක්ක දේශනය වදාළ සේක.

අතිශයින් ම සතුටට පත් වූ ඒ පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද මේ ශ්‍රී සද්ධර්මය මහත් සොම්නසින් යුතු ව පිළිගත්තාහු ය.

මේ ධම්මචක්ක දේශනය වදාරණ කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට "හේතු - ප්‍රත්‍යයන් ගෙන් හට ගන්නා වූ යම් දෙයක් ඇත් ද, හේතූන් නිරුද්ධ වීමෙන් ඒ සියල්ල ම නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්ත ය"යි කියා කෙලෙස් රහිත වූ අවිද්‍යා මලකඩ රහිත වූ දහම් ඇස පහළ විය.

(භාග්‍යවතුන් වහන්සේ විසින් දම් සක් දෙසුම වදාළ කල්හි,) "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය"යි කියා පොළොව වාසී දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

පොළොවවාසී දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය"යි කියා චාතුම්මහාරාජික දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

චාතුම්මහාරාජික දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය"යි කියා තාවතිංස දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

තාවතිංස දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය"යි කියා යාම දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

යාම දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ

බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා තුසිත දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

තුසිත දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා නිම්මාණරතී දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

නිම්මාණරතී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා පරනිම්මිතවසවත්ති දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

පරනිම්මිත වසවත්ති දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා බ්‍රහ්මපාරිසජ්ජ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා බ්‍රහ්ම පුරෝහිත දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

බ්‍රහ්ම පුරෝහිත දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා මහාබ්‍රහ්ම දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

මහාබ්‍රහ්ම දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා පරිත්තාභ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

පරිත්තාභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අප්පමාණාභ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

අප්පමාණාභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින්

බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා ආභස්සර දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

ආභස්සර දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා පරිත්තසුභ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

පරිත්තසුභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අප්පමාණසුභ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

අප්පමාණ සුභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා සුභකිණ්හ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

සුභකිණ්හ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා වේහප්ඵල දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

වේහප්ඵල දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝබ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අවිහ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

අවිහ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අතප්ප දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

අතප්ප දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා සුදස්ස දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

සුදස්ස දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා සුදස්සී දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

සුදස්සී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අකනිට්ඨ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

ඒ ක්ෂණයෙහි ම ඒ මොහොතහි ම, බ්‍රහ්ම ලෝක යම් තාක් වේ ද ඒතාක් ම මේ දහම් ඝෝෂාව පැතිර ගියේ ය. මේ දස දහසක් ලෝක ධාතුව ම කම්පා විය. තදින් ම කම්පා විය. බලවත්ව කම්පා විය.

දෙවියන් ගේ දේවානුභාවය ඉක්මවා ගිය අප්‍රමාණ වූ ආලෝකයක් ලෝකයෙහි පැතිර ගියේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ උදානයක් පහළ කළ සේක. ‘‘භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා. භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා.’’

මේ ආකාරයෙන් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට ‘‘අඤ්ඤා කොණ්ඩඤ්ඤ‘‘ යන නාමය ඇති වූයේ ය!

**සාදු සාදු සාදු..!!!**

# ධම්මචක්කප්පවත්තන සුත්තං (පාළි-සිංහල)

## ධම්මචක්ක පවත්තන සූත්‍රය (පාළි-සිංහල)

**ඒවං මේ සුතං. ඒකං සමයං භගවා බාරාණසියං විහරති, ඉසිපතනේ මිගදායේ. තත්‍ර ඛෝ භගවා පඤ්චවග්ගියේ භික්ඛූ ආමන්තේසි.**

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් මිගදායෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන් අමතා මේ ධම්මචක්ක දේශනය වදාළ සේක.

**ද්වේ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතේන න සේවිතබ්බා. යෝ චායං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ.**

පින්වත් මහණෙනි, පැවිද්දන් විසින් සේවනය නො කළ යුතු වූ මේ අන්ත දෙකකි. යම් ඒ, කාමයන්හි කාමසුඛයෙහි ඇලී ගැලී වාසය කිරීමක් ඇත් ද, මෙය හීන වූ දෙයකි. ලාමක වූ දෙයකි. පුහුදුන් ජනයා විසින් සේවනය කරන දෙයකි. උත්තම මිනිසුන් විසින් සේවන නොකරන දෙයකි. අනර්ථ සහිත දෙයකි.

**යෝ චායං අත්තකිලමථානුයෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථසංහිතෝ.**

පින්වත් මහණෙනි, යම් ඒ, තමාව පීඩාවට පත් කරවන වැඩපිළිවෙළක් ඇත් ද, එය දුක් සහිත දෙයකි. උත්තම මිනිසුන් විසින් සේවනය නො කරන දෙයකි. අනර්ථ සහිත දෙයකි.

**එතේ තේ ඛෝ, භික්ඛවේ, උභෝ අන්තේ අනුපගම්ම, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.**

පින්වත් මහණෙනි, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරන ලදි. මේ මධ්‍යම ප්‍රතිපදාව දහම් ඇස ලබා දෙයි. නුවණ උදා කරයි. සංසිඳීම ඇති කරයි. විශේෂ ඤාණය ඇති කරයි. අවබෝධය ඇති කරයි. නිවණ පිණිස පවතින්නේ ය.

**කතමා ච සා, භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති?**

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, විශේෂ ඥානය ඇති කරන, අවබෝධය ඇති කරන, නිවණ පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක් ද..?

**අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, සෙය්‍යථීදං – සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි.**

ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකල්පය ද, සම්මා වාචා, සම්මා කම්මන්තය ද, සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද සම්මා සමාධිය ද යන මෙය යි.

**අයං ඛො සා, භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා, චක්ඛුකරණී**

**ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.**

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, විශේෂ ඥානය ඇති කරන, අවබෝධය ඇති කරන, නිවණ පිණිස පවතින්නා වූ ඒ මධ්‍යම ප්‍රතිපදාව නම් මෙය යි.

**"ඉදං ඛො පන, භික්ඛවේ, දුක්ඛං අරියසච්චං.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි.

**ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛෝ, මරණම්පි දුක්ඛං, අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ, පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං. සංඛිත්තේන, පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.**

ඉපදීම ද දුකකි. ජරාවට පත්වීම ද දුකකි, රෝග පීඩා වැළඳීම ද දුකකි. මරණය ද දුකකි. අප්‍රිය පුද්ගලයින් හා අප්‍රිය වස්තූන් සමග එක්වීම ද දුකකි. ප්‍රිය පුද්ගලයින් හා ප්‍රිය වස්තූන් ගෙන් වෙන්වීම ද දුකකි. කැමැති වන්නා වූ යම් දෙයක් ඇත් ද එය නො ලැබීම ද දුකකි. සංක්ෂේපයෙන් කීවොත්, පංච උපාදානස්කන්ධයෝ ම දුකකි.

**"ඉදං ඛෝ පන, භික්ඛවේ, දුක්ඛසමුදයං අරියසච්චං – යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙයාථීදං – කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය යි. පුනර්භවය ඇති කරන, ආශ්වාදයෙන් ඇලෙන්නා වූ, ඒ ඒ තැන සතුටින් පළිගන්නා වූ යම් ඒ තණ්හාවක් ඇත් ද එය යි. එනම් කාම තණ්හාවය, භව තණ්හාව ය, විභව තණ්හාව ය.

**"ඉදං ඛෝ පන, භික්ඛවේ, දුක්ඛනිරෝධං අරියසච්චං – යෝ තස්සා යේව තණ්හාය අසේසවිරාගනිරෝධෝ, චාගෝ, පටිනිස්සග්ගෝ, මුත්ති, අනාලයෝ.**

"පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම නම් වූ ආර්ය සත්‍යය යි. ඒ තණ්හාවේ ම ඉතිරු නැති ව නො ඇල්මෙන් නිරුද්ධ වීමක් වේ ද, දුරු වීමක් වේ ද, තණ්හාවෙන් මිදීමක් වේ ද, ආලය නැති වීමක් වේ ද, එය යි.

**"ඉදං ඛෝ පන, භික්ඛවේ, දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං – අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, සෙයාථීදං – සම්මාදිට්ඨී, සම්මාසඞ්කප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය යි. එනම්, සම්මා දිට්ඨිය ද, සම්මා සංකල්පය ද, සම්මා වාචා, සම්මා කම්මන්තය ද, සම්මා ආජීවය ද, සම්මා වායාමය ද, සම්මා සතිය ද සම්මා සමාධිය ද යන මෙය යි.

**"ඉදං දුක්ඛං අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් ම අවබෝධ කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් ම අවබෝධ කරන ලදි'යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**"ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක ඇති වීම නම් වූ ආර්ය සත්‍යය යි (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක් ඇති වීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහීනන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක් ඇති වීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය වූයේ ය යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**"ඉදං දුක්ඛනිරෝධං අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම නම් වූ ආර්ය සත්‍යය යි කියා (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැති වීම නම් වූ ආර්ය සත්‍යය (විද්‍යා විමුක්ති වශයෙන්) සාක්ෂාත් කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ

විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකතන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැති වීම නම් වූ ආර්‍ය සත්‍යය (විද්‍යා විමුක්ති වශයෙන්) සාක්ෂාත් කරන ලදි යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**“ඉදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්‍ය සත්‍යය යි කියා (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං භාවේතබ්බන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්‍ය සත්‍යය (ශීල-සමාධි-ප්‍රඥා වශයෙන්) ප්‍රගුණ කළ යුතු යි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං භාවිතන්ති මේ, භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැති වීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්‍ය සත්‍යය (ශීල-සමාධි-ප්‍රඥා වශයෙන්) ප්‍රගුණ කරන ලදි යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**“යාවකීවඤ්ච මේ, භික්ඛවේ, ඉමේසු චතූසු අරියසච්චේසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහෝසි, නේව තාවාහං, භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.**

පින්වත් මහණෙනි, මේ චතුරාර්‍ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතු ව, ආකාර දොළොසකින් යුතු ව සැබෑ තත්වය නම් වූ ඥාන දර්ශනය සුවිශුද්ධ ලෙස මා හට යම්තාක් අවබෝධ නො වූයේ වේ ද, ඒ තාක් කල් ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයෙහි, මරුන් සහිත වූ බඹුන් සහිත වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ “මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි“යි ප්‍රතිඥා නො දුන්නෙමි.

**යතෝ ච ඛෝ මේ, භික්ඛවේ, ඉමේසු චතූසු අරියසච්චේසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහෝසි, අථාහං, භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.**

එහෙත් පින්වත් මහණෙනි, මා හට යම් කලක මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතු ව, ආකාර දොළොසකින් යුතු ව සැබෑ තත්වය නම් වූ ඥාන දර්ශනය සුවිශුද්ධ ලෙසට ම අවබෝධ වූයේ වේ ද, එකල්හි පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයෙහි, මරුන් සහිත වූ බඹුන් සහිත වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ “මම් චනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි“යි ප්‍රතිඥා දුන්නෙමි.

**ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි – අකුප්පා මේ විමුත්ති, අයමන්තිමා ජාති, නත්ථි දානි පුනබ්භවෝ’’ති. ඉදමවෝච භගවා අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.**

මා හට ඥාණ දර්ශනය පහළ විය. මාගේ චේතෝවිමුක්තිය වෙනස් නොවන්නේ ය. මෙය චනාහී අන්තිම ඉපදීම වේ. දැන් මා හට පුනර්භවයක් නැත්තේ යයි, භාග්‍යවතුන් වහන්සේ මේ ධම්මචක්ක දේශනය වදාළ සේක. අතිශයින් ම සතුටට පත් වූ ඒ පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද මේ ශ්‍රී සද්ධර්මය මහත් සොම්නසින් යුතු ව පිළිගත්තාහු ය.

**ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි – “යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරෝධධම්ම’’න්ති.**

මේ ධම්මචක්ක දේශනය වදාරණ කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට “හේතු - ප්‍රත්‍යයන් ගෙන් හට ගන්නා වූ යම් දෙයක් ඇත් ද, හේතූන් නිරුද්ධ වීමෙන් ඒ සියල්ල ම නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්ත ය“යි කියා කෙලෙස් රහිත වූ අවිද්‍යා මලකඩ රහිත වූ දහම් ඇස පහළ විය.

**පවත්තිතේ ච පන භගවතා ධම්මචක්කේ, භුම්මා දේවා සද්දමනුස්සාවේසුං – “එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

(භාග්‍යවතුන් වහන්සේ විසින් දම් සක් දෙසුම වදාළ කල්හි,) “අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය චනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය“යි කියා පොළොව වාසී දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

**භුම්මානං දේවානං සද්දං සුත්වා චාතුමහාරාජිකා දේවා සද්දමනුස්සාවේසුං – “එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

පොළොවවාසී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, “අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය චනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය“යි කියා චාතුම්මහාරාජික දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

**චාතුමහාරාජිකානං දේවානං සද්දං සුත්වා තාවතිංසා දේවා සද්දමනුස්සාවේසුං – “එතං**

**භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

චාතුම්මහාරාජික දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා තාවතිංස දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**තාවතිංසානං දේවානං සද්දං සුත්වා යාමා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

තාවතිංස දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා යාම දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**යාමානං දේවානං සද්දං සුත්වා තුසිතා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

යාම දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා තුසිත දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**තුසිතානං දේවානං සද්දං සුත්වා නිම්මාණරතී දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

තුසිත දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා නිම්මාණරතී දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**නිම්මාණරතීනං දේවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්තිනෝ දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි**

**වා ලෝකස්මි''න්ති.**

නිම්මාණරතී දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා පරනිම්මිතවසවත්ති දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**පරනිම්මිතවසවත්තීනං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දේවා සද්දමනුස්සාවේසුං – "එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

පරනිම්මිත වසවත්ති දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා බ්‍රහ්මපාරිසජ්ජ දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරෝහිතා දේවා සද්දමනුස්සාවේසුං – "එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා බ්‍රහ්ම පුරෝහිත දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**බ්‍රහ්මපුරෝහිතානං දේවානං සද්දං සුත්වා මහාබ්‍රහ්මා දේවා සද්දමනුස්සාවේසුං – "එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

බ්‍රහ්ම පුරෝහිත දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා මහාබ්‍රහ්ම දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**මහාබ්‍රහ්මානං දේවානං සද්දං සුත්වා පරිත්තාභා දේවා සද්දමනුස්සාවේසුං – "එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

මහාබ්‍රහ්ම දෙවියන් ගේ දහම් සෝෂාව අසා, "අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස

ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා පරිත්තාභ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

**පරිත්තාභානං දේවානං සද්දං සුත්වා අප්පමාණාභා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

පරිත්තාභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා අප්පමාණාභ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

**අප්පමාණාභානං දේවානං සද්දං සුත්වා ආභස්සරා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

අප්පමාණාභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා ආභස්සර දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

**ආභස්සරානං දේවානං සද්දං සුත්වා පරිත්තසුභා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

ආභස්සර දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය''යි කියා පරිත්තසුභ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

**පරිත්තසුභානං දේවානං සද්දං සුත්වා අප්පමාණසුභා දේවා සද්දමනුස්සාවේසුං – ''එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි''න්ති.**

පරිත්තසුභ දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ''අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි

වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අප්පමාණසුභ දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභකිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

අප්පමාණ සුභ දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා සුභකිණ්හ දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

සුභකිණ්හ දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා වේහප්ඵල දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**වේහප්ඵලා දේවානං සද්දං සුත්වා අවිහා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

වේහප්ඵල දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අවිහ දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**අවිහානං දේවානං සද්දං සුත්වා අතප්පා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

අවිහ දෙවියන් ගේ දහම් සෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අතප්ප දෙවියෝ දහම් සෝෂාව පැවැත්වූවාහු ය.

**අතප්පානං දේවානං සද්දං සුත්වා සුදස්සා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

අතප්ප දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා සුදස්ස දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වුවාහු ය.

**සුදස්සානං දේවානං සද්දං සුත්වා සුදස්සී දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

සුදස්ස දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා සුදස්සී දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වුවාහු ය.

**සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකනිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං – ‘‘එතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මි’’න්ති.**

සුදස්සී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා, ‘‘අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම ය‘‘යි කියා අකනිට්ඨ දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වුවාහු ය.

**ඉතිහ, තෙන ඛණේන, තේන මුහුත්තේන යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගච්ඡි. අයඤ්ච දසසහස්සිලෝකධාතු සංකම්පි සම්පකම්පි සම්පවේධි; අප්පමාණෝ ච උළාරෝ ඔභාසෝ ලෝකේ පාතුරහෝසි, අතික්කම්ම දේවානං දේවානුභාවං.**

ඒ ක්ෂණයෙහි ම ඒ මොහොතහි ම, බ්‍රහ්ම ලෝක යම් තාක් වේ ද ඒතාක් ම මේ දහම් ඝෝෂාව පැතිර ගියේ ය. මේ දස දහසක් ලෝක ධාතුව ම කම්පා විය. තදින් ම කම්පා විය. බලවත්ව කම්පා විය. දෙවියන් ගේ දේවානුභාවය ඉක්මවා ගිය අප්‍රමාණ වූ ආලෝකයක් ලෝකයෙහි පැතිර ගියේ ය.

**අථ ඛෝ භගවා ඉමං උදානං උදානේසි – ‘‘අඤ්ඤාසි වත, භෝ කොණ්ඩඤ්ඤෝ, අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ’’ති. ඉති හිදං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස ‘අඤ්ඤාසිකොණ්ඩඤ්ඤෝ’ ත්වේව නාමං අහෝසී‘ති.**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ උදානයක් පහළ කළ සේක. ‘‘භවත් කොණ්ඩඤ්ඤ තෙමේ

ඒකාන්තයෙන් ම අවබෝධ කළා. භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා.”

මේ ආකාරයෙන් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට “අඤ්ඤා කොණ්ඩඤ්ඤ“ යන නාමය ඇති වූයේ ය!

**සාදු සාදු සාදු..!!!**

**(සිංහල පරිවර්ථනය - පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ විසිනි, "සැදැහැවතුන් ගේ වන්දනා පොති"න් උපුටා ගන්නා ළදි.)**

WebSite | Google Group | FaceBook